සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 01 |

## නැටුම් (දේශීය) I

* සියලුම සිසුන් 1 කොටසේ මුල් ප්‍රශ්න 30ටම අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව II උඩරට නර්තන හෝ III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් අංක 31 සිට අංක 40 දක්වා පිළිතුරු සැපයිය යුතුයි.

* II, III හා IV වන කොටස්වලින් අංක 31 සිට 40 දක්වා කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතුයි.

* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

* I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

- **අංක 01 සිට 10 දක්වා ඇති වාක්‍යයන්හි හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන් තුනේම ගොඩ සරඹ, ඉලංගම්සරඹ, .............. පද ත්‍රිවිධ ලය අනුව නර්තනය කරයි.
   1. පා සරඹ 2. වට්ටම් 3. දොඹින 4. මාත්‍රාපද

2. ........................... යන කර්මාන්ත ඇසුරින් නර්තන නිර්මාණයේදී ඉල්ලම් ගැරීම, පොරණුවට දැමීම, කප්පාදු කිරීම යන ක්‍රියාකාරකම් වල සුවිශේෂ ලක්ෂණ දක්නට ලැබේ.
   1. පතල්, මැටි, තේ 3. පතල්, කොහු, කෘෂි
   2. පතල්, මැටි, කෘෂි 4. ධීවර, මැටි, තේ

3. ආගමික හා සමාජීය කටයුතු සඳහා භාවිත වාදන විශේෂයන් ය.
   1. රබන් හා හේවිසි වාදනය 2. රණ බෙර හා මළබෙර වාදනය
   3. හේවිසි හා තේවා වාදනය 4. හේවිසි හා රබන් වාදනය

4. ........................... ගද්‍ය හා පද්‍ය ලක්ෂණ දැකිය හැකි ගායන විශේෂයකි.
   1. නමස්කාර ගාථා 2. චාමර කවි
   3. ටිකා සී පද 4. රබන් කවි

5. හින්දු බාලිකාවන් 500 ක් නර්තනයේ යෙදුන ආකාරය .............................. ගේ වාර්තාවේ සඳහන් වේ.

1. ස්පිල් බර්ජන්
2. රොබට් නොක්ස්
3. පාහියන් භික්ෂුව
4. ඉබන් බතුතා

6. පොළොන්නරු යුගයේ රජකල මහා පරාක්‍රමබාහු රජු හමුදාවේ ආස්වාදය පිණිස නළගනන්ගේ රැඟුම් දක්වූ බව .............................. සඳහන් වේ.

1. මහාවංශයේ
2. චූලවංශයේ
3. දීපවංශයේ
4. සමන්තපාසාධිකාවේ

7. "රටකට මව් සමගින් ඒ නැව් නැග......" මෙය..............................කවියකි.

1. රබන්
2. චාමර
3. ඔන්චිලි වාරම්
4. නමස්කාර

8. .............................. මගින් මිනිස් හා සත්ත්ව චරිත වේදිකාවට උචිතවන ආකාරයට සකස් කරනු ලබයි.

1. අලෝකකරණය
2. අංග රචනය
3. නර්තනය
4. රංග රචනය

9. "අටදෙන අටකොණ වාඩි වෙයල්ලා...." මෙය .............................. කවියකි

1. චාමර
2. ප්‍රශස්ති
3. ඔංචිලිවාරම්
4. රබන්

10. වේදිකා සැරසිලි, රංග වාස්ත්‍රාභරණ, විදුලි ආලෝකය මගින් අදහස් ප්‍රකාශ කිරීම .............................. නමින් හඳුන්වයි.

1. ආංගික අභිනයයි
2. සාත්වික අභිනයයි
3. වාචික අභිනයයි
4. ආහාර්ය අභිනයයි

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| I | විදුර නාට්‍ය | චන්ද්‍ර ලේඛා පෙරේරා මිය | මළ බෙර | පොකුණුවිට |
| II | වජිරා චිත්‍රසේන මිය | රණ බෙර | කරදිය | ශ්‍රීමති රසාදරී මිය |
| III | වද බෙර | බෙර හඬ | මිරැන්ඩා හේමලතා | මගුල් බෙර |
| IV | හගුරන්කෙත | මිරිස්ස | විගඩ | නරිබෑනා |

11. "මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ..." යන නූර්තිය ඇතුළත් වේදිකා නාට්‍යයේ නම සඳහන් වී ඇත්තේ,

1. I පේළියේ A තීරුවේය.
2. II පේළියේ C තීරුවේය.
3. III පේළියේ B තීරුවේය.
4. IV පේළියේ D තීරුවේය.

12. බෙර වාදනයේදී වීර රසය උපදින වාදන අංගය දක්වෙන්නේ,

1. III පේළියේ A තීරුවේය.
2. II පේළියේ B තීරුවේය.
3. I පේළියේ C තීරුවේය.
4. III පේළියේ D තීරුවේය.

13. කරදිය මුද්‍රා නාට්‍යයේ ප්‍රධාන චරිත නිරූපණය කරන ප්‍රවීණ නර්තන ශිල්පිණියගේ නම සඳහන් වන්නේ,

1. II පේළියේ A තීරුවේ
2. I පේළියේ B තීරුවේ
3. III පේළියේ C තීරුවේ
4. II පේළියේ D තීරුවේ

14. බන්දුල ජයවර්ධන ශූරීන් නිර්මාණය කළ නාට්‍යයේ නම සඳහන් වී ඇත්තේ,

1. I පේළියේ A තීරුවේය
2. II පේළියේ C තීරුවේය
3. III පේළියේ B තීරුවේය
4. IV පේළියේ D තීරුවේය.

15. සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් දක්වෙන්නේ

1. IV පේළියේ A තීරුවේ ය.
2. IV පේළියේ B තීරුවේ ය.
3. IV පේළියේ C තීරුවේ ය.
4. I පේළියේ D තීරුවේ ය.

16. ප්‍රශස්ති කවි භාවිතා කර ගනිමින් නර්තනයේ යෙදෙන ගැමි නැටුමකි.,

1. පංතේරු 2. කඩු 3. තාලම් 4. චාමර

17. මුද්‍රා නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය ලෙස සලකන්නේ.

1. 1930-1950 ය.
2. 1950-1970 ය.
3. 1940-1960 ය.
4. 1950-1960 ය.

18. "මේරුං විරාජිත සමත් ............................" මෙම කවිය

1. ටීකා සී පදයකි.
2. ඔංචිලි වාරම් කවියකි.
3. නමස්කාර ගාථාවකි
4. රබන් කවියකි

19. ළමයින්ගේ මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන පාරිසරික සාධක කොටස්

1. 2 කි. 2. 3 කි. 3. 4 කි. 4. 5 කි.

20. "අතකට ගෙන රබන් පොඩිය ..........................." මෙම කවිය ගායනා කරනු ලබන්නේ,

1. මැදුම් මහ දෙතිතටය.
2. සුළු තනි තිතටය.
3. මහා තනි තිතතටය.
4. මැදුම්, තනි තිතටය.

- **ප්‍රශ්න අංක 21 සිට 24 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් රූපසටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**





21. A රූපයෙන් දක්වෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,

1. මනිපුරි ය.
2. කථකලි ය.
3. කථක් ය.
4. භරත ය.

22. B රූපයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය හඳුන්වනු ලබන්නේ,

1. චෙන්ඩා නමිනි
2. මද්දලය නමිනි
3. එඩැක්ක නමිනි
4. ඉලතාලම් නමිනි

23. A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ,

1. රවීන්ද්‍රනාත් තාගෝර්තුමාටය
2. චක්කියර් වරුන්ටය
3. වල්ලතෝල් නාරායන මෙනන්ටය
4. තාන්ජාවූර් සංභාදරයන්ටය

24. මෙම නර්තන සම්ප්‍රදාය උගන්වන ප්‍රධාන ආයතනය වනුයේ,

1. ශාන්ති නිකේතනය
2. කලා ක්ෂේත්‍රම් ය
3. ලක්නව් භාත්බණ්ඩ විශ්වවිද්‍යාලය
4. කේරළ කලා මණ්ඩලම් ය

25. සුදු පිරුවටයකින් වසා වාදනය කරනු ලබන්නේ,

1. මළ බෙරය
2. වද බෙරය
3. රණ බෙරය
4. මඟුල් බෙරය



26. මෙම රූපයෙන් දැක්වෙන්නේ,

1. කරදිය මුද්‍රා නාට්‍යයේ ජවනිකාවකි
2. විදුර නාට්‍යයේ ජවනිකාවකි
3. සොකරි ගැමි නාට්‍යයේ ජවනිකාවකි
4. බෙරහඬ වේදිකා නාට්‍යයේ ජවනිකාවකි

27. නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය නොවන්නේ,

1. ජය පරාජය සමසිතින් පිළිපැදීම
2. ඉවසීම නොමැති කම
3. තර්කානුකූල චින්තනය
4. නිර්මාණශීලි චින්තනය

28. සොකරි ගැමි නාටකය රඟ දැක්වීමට වන්නි ප්‍රදේශයේදී උපයෝගී කරගන්නා වාද්‍ය භාණ්ඩය වනුයේ,

1. දවුල යි.
2. ගැටබෙරය යි.
3. යක්බෙරය යි.
4. උඩැක්කිය යි

29. සොකරි ගැමි නාටකයේ චරිත

1. සොකරි, ගුරු හාමි, ජසයා
2. වෙදරාල, ආඬිගුරු, පරයා
3. ආඬිගුරු, ජසයා, සොකරි
4. වෙදරාළ, පරයා, නොංඩි

30. විස්මය නමැති ස්ථායි භාවයෙන් උපදින්නේ,

1. අත්භූත රසය යි
2. වීර රසය යි
3. කරුණා රසය යි
4. ශෘංගාර රසය යි

3586

## II කොටස - (උඩරට නර්තනය)

31. තක්කඩ තඩතක ජිජිකුද -ජිත්කඩ කඩතක ජිජිකුද...... මෙම කස්තිරම නටනු ලබන්නේ,

1. 09 වන ගොඩ සරඹයට ය
2. 10 වන ගොඩ සරඹයටය
3. 11 වන ගොඩ සරඹයට ය
4. 12 වන ගොඩ සරඹයටය

32. මාත්‍රා 2+4 දෙතිතට අයත් වන්නමකි

1. නෛඅඩි වන්නම
2. සැවුලා වන්නම
3. සිංහරාජ වන්නම
4. තුරඟා වන්නම

33. තාත් ජිං තත් තත් - ජිං තත් ජිං තත් තත්....... මෙම පද කොටස

1. දෙංජිංත ගත දොංත වට්ටමේ අඩව්වකි
2. කුදංත ගත දොං වට්ටමේ කස්තිරමකි
3. කුද කුජිගත වට්ටමේ අඩව්වකි
4. දොං ජිංත ගත දොංත වට්ටමේ කස්තිරමකි.

34. රූප සටහනින් දැක්වෙන වාද්‍ය භාණ්ඩයෙන් වාදන වන මූලික බීජාක්ෂර සතර වන්නේ

1. තත් දිත් තොං නං ය
2. තත් ජිත් තොං ගුම් ය.
3. තකට තකට කුද කුදා ය.
4. තත් ජිත් තොං නං ය.



35. සිංහරාජ වන්නමට අයත් තාල රූපය වනුයේ

1. මාත්‍රා 4 + 4 තනිතිත ය.
2. මාත්‍රා 2 + 3 දෙතිත ය.
3. මාත්‍රා 3 + 3 තනිතිත ය.
4. මාත්‍රා 3+4 දෙතිත ය.

36. "බර අත්ගෙන කගින් ........" මෙම කවි පාදයේ ඉතිරි කවි පාදය වනුයේ

1. ජයගෙන කඳ කුමරුන්
2. ඇනකොන්තවි වලින්
3. දෙපලුව අසුරසෙන්
4. පලුදෙක ගෙන සැනෙකින්

37. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ නර්තන අංග දෙකකි.

1. කොහොඹා හැල්ල - යහන් දැක්ම
2. ආවැන්දුම - පන්දම් පද
3. කුවේණි අස්න - තෙල්මේ නැටීම
4. කොහොඹා හැල්ල-කුවේණි අස්න

38. තත් තකට............................ තක්කඩ තක්කඩ කුද ............................ තක රොං ගජිං ජිකුද ............................ කුංදත් ජික රොං

මෙහි හිස්තැන්වලට අයත් පද කොටස් වන්නේ,

1. තකරොං - කුංදත් - කිටි තකට
2. කුංදත් - තකරොං - ජිකුතකට
3. තකරොං - තකරොං - කිටි තකට
4. තකරොං - ජිංජිකුද - කිටිතකට

39. අවුල් හැරය, වෙස් තට්ටුව, බුබුළු පටිය යන රංග වස්ත්‍රාභරණ කොටස් අයත් වන්නේ,

1. වෙස් ඇඳුම් කට්ටලයටය.
2. නෛයඩි ඇඳුම් කට්ටලයටය
3. පන්තේරු ඇඳුම් කට්ටලයටය
4. උඩැක්කි ඇඳුම් කට්ටලයටය

40. දේශීය රංග වස්ත්‍රාභරණ සකස් කිරීමේදී බහුලව යොදා ගන්නා වර්ණ දෙකකි.

1. සුදු - කහ
2. සුදු - රතු
3. නිල් - කළු
4. කහ - රතු

## III කොටස (පහතරට නර්තනය)

31. "රිම්ගත ගුද ගත්තම්, රිම් ගත ගුද ගත්තම්" ....... මෙම ඉරට්ටිය නටනු ලබන්නේ,

1. 09 වන ඉලංගම් සරඹයටය
2. 10 වන ඉලංගම් සරඹයටය
3. 11 වන ඉලංගම් සරඹයටය
4. 12 වන ඉලංගම් සරඹයටය

32. මාත්‍රා 2+4 දෙතිතට අයත් සින්දු වන්නමකි.

1. අනුරාග දණ්ඩ තාලයේ සිංදු වන්නම
2. නාතිලිංචි තාලයේ සිංදු වන්නම
3. භාවාදී තාලයේ සිංදු වන්නම
4. හනුමන්තා තාලයේ සිංදු වන්නම

33. ගුංදත් ගහිතිගදිරිකිට ගත ගත// ගහිතිගතම්...... මෙම පද කොටස

1. ගුද ගුතිගත වට්ටමේ දෙවන ඉරට්ටි යයි.
2. ගුද ගතිගත වට්ටමේ අන්තාඩි යයි
3. ගුද ගතිගත වට්ටමේ පළමු ඉරට්ටි යයි
4. ගුද ගතිගත වට්ටමේ දෙවන පදයයි.

34. රූප සටහනින් දැක්වෙන භාණ්ඩයෙන් වාදනය වන මූලික බීජ අක්ෂර සතර වන්නේ,



1. තත්, ජිත්, තොං නං ය.
2. තත්, දිත්, තොං, ගුම් ය
3. ගුහිති ගහිති, ගුහිති ගහිතිය
4. තත්, දිත්, තොං, නං ය.

35. අනුරාග දණ්ඩ තාලයේ සිංදු වන්නමට අයත් තාල රූපය වනුයේ,

1. මාත්‍රා 4 + 4 තනි තිතය.
2. මාත්‍රා 2+3 දෙතිත ය.
3. මාත්‍රා 3+3 තනි තිතය.
4. මාත්‍රා 3 + 4 දෙතිත ය.

36. "සඳ සන්දර පැරදුන මෙන්...." මෙම කවි පාදයේ ඉතිරි කවි පාද වනුයේ,

1. අදගත් ලෙසටා
2. සැඟවී මෙර ගිරටා
3. දිළිමන් ඔබ යසටා
4. සෙතදෙන් සවි සතටා

37. දොවොල් මඩු ශාන්ති කර්මයේ නර්තන අංග දෙකකි..

1. දෙවොල්ගොඩ බැසීම - මල්මඩුපුරය
2. තෙල්මෙ නැටීම - ඌරා යක්කම
3. පත්තිනි නැටීම - කුවේණි අස්න
4. තෙල්මෙ නැටීම - වාහල නැටීම

38. ගුංදත් ගුභිති ........................... ගත ගත ........................... තත් දිත් ........................... දොම්

මෙහි හිස්තැන්වලට අයත් පද කොටස් වන්නේ,

1. ගභිතිගතම් - ගදිරිකිට - තත්දිගතම්
2. තත් - දිගතම් - ගදිරිකිං - ගභිතිගතම්
3. ගදිරිකිට - ගභිතිගතම් - තත් දිගතම්
4. ගදිරි කිං - තත් දිගතම් - ගභිතිගතම්

39. තෙල් කච්චිය, ඉන පටිය, නළල් පටිය, යන අංග වස්ත්‍රාභරණ කොටස් අයත් වන්නේ,

1. තෙල්මේ ඇඳුම් කට්ටලයටයි
2. දෙවොල් ඇඳුම් කට්ටලයටයි
3. නෛඅඩි ඇඳුම් කට්ටලයටයි
4. ගිරිදේවි ඇඳුම් කට්ටලයටයි.

40. දේශීය රංග වස්ත්‍රාභරණ සකස් කිරීමේදී බහුලව යොදා ගන්නා වර්ණ දෙකකි.

1. සුදු - කහ
2. සුදු - රතු
3. නිල් - කළු
4. කහ - රතු

## IV කොටස (සබරගමු නර්තනය)

31. "තරිකිට දිරිකිට්, දිරිකිට තරිකිට...... මෙය,

1. 10 වන දොඹින පදය වේ.
2. 12 වන දොඹින පදය වේ.
3. 11 වන දොඹින පදය වේ.
4. හමාර පදය වේ.

32. මාත්‍රා 3+4 දෙතිතට අයත් වන්නමකි.

1. විරාඩි වන්නම
2. මණ්ඩුක වන්නම
3. කුදිරඩි වන්නම
4. කදම්භ පක්ෂි වන්නම

33. "තත් කිටහර් ජික්කිට කුං......" මෙම පද කොටස

1. ගමන් මාත්‍රයේ අඩව්වයි
2. පට්ටුතාල මාත්‍රයේ අඩව්වයි
3. ගමන් මාත්‍රයේ කලාසමයි
4. පට්ටුතාල මාත්‍රයේ කලාසමයි.

34. රූප සටහනින් දක්වෙන භාණ්ඩයෙන් වාදනය වන මූලික බීජාක්ෂර සතර වන්නේ,



1. තත්, දිත්, තොං නං ය.
2. තත්, දිත්,ජිත් නං ය.
3. තකට,ජිකට, තකටජිකට ය.
4. තත්,ජිත්, තොං, නං ය.

35. විරාඩි වන්නමට අයත් තාල රූපය වනුයේ,

1. මාත්‍රා 4 + 4 තනි තිතය
2. මාත්‍රා 2 + 3 දෙතිතය
3. මාත්‍රා 3 + 3 තනි තිතය
4. මාත්‍රා 3 + 4 දෙතිතය.

36. "අහස් කුසේ වැසි ගුවනින් එන විට........ මෙම කවියේ ඉතිරි කවි පාදය වනුයේ,

1. දහස් ගණන් හැඩු මණ්ඩුකයෝ සිට
2. දහස් ගණන් විල ගිය සක්වල වට
3. අයියෝ මෙ වන්නම කියා දියන් මට
4. දෙවියනි පෙර සිට තිබුණේ මෙලෙසට

37. පහත් මඩු ශාන්තිකර්මයේ නර්තන අංග දෙකකි.

1. මල් මඩු පුරය - ආවැන්දුම
2. පන්දම් පද - උඟරා යක්කම
3. තෙල්මෙ නැටීම - කුවේණි අස්න
4. මල්මඩුපුරය - දේවකෝල් පාඩුව

38. තත් කිටහර් ජික්කිට කුං ............................ ගති කිටහර් ජික්කිට කුං තත් තිත්තත් ගත තිත් තත් ............................ තතුද ගතත් ............................ කුදතා

මෙහි හිස්තැන් වලට අයත් පද කොටස් වන්නේ,

1. දෝංත ගත්තත් කිටිතක - තත් කිත්තත් ගත කිත්තත් -කුදගත
2. තත් තිත් තත් ගත තිත්තත් - කුදගත - දෝං ගත්තත් කිටි තක
3. තත් කිත් තත් ගත කිත් තත් -දෝංතගත්තත් කිටි තක - කුදගත
4. කුදගත දෝංත ගත්තත් කිටිතක- තත් කිත් තත් ගත කිත්තත්

39. නෙත්තිමාලය, හැඩ තැල්ල, ඉනපටිය යන රංග වස්ත්‍රාභරණ කොටස් අයත් වන්නේ,

1. පබළු ඇඳුම් කට්ටලයටයි
2. වෙස් ඇඳුම් කට්ටලයටයි
3. තනි කච්චි ඇඳුම් කට්ටලයටයි
4. තෙල්මේ ඇඳුම් කට්ටලයටයි

40. දේශීය රංග වාස්ත්‍රාභරණ සකස් කිරීමේදී බහුලව යොදා ගන්නා වර්ණ දෙකකි.

1. සුදු - කහ 2. සුදු-රතු 3. නිල්-කළු 4. කහ-රතු

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | නර්තනය (දේශීය) | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 2 | |

## නැටුම් (දේශිය) II පත්‍රය

**සැලකිය යුතුයි.**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

---

1. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

    I. සන්නිවේදන කාර්ය සඳහා අතීතයේ සිට භාවිත කළ විතතාතත භාණ්ඩයක් ලෙස .................................. හැඳින්විය හැක.

    II. .................................. කොහොඹ කංකාරි ශාන්ති කර්මයේ දී වාදනය තරගකාරි ස්වරූපයකින් වාදනය කරයි.

    III. "ඉහළ වෙලේ යන නෑනෝ පහල වෙලේ යන නෑනෝ.." මෙය .................................. ගායනයක කොටසකි.

    IV. ජාතික අධ්‍යාපන ආයතනයේ නර්තන අංශයේ අධ්‍යක්‍ෂ වරියක ලෙස කටයුතු කල .................................. මහත්මිය ප්‍රවීණ නර්තන ශිල්පිණියකි.

    V. මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරීම .................................. අභිනය නමින් හඳුන්වයි.

    VI. කමත රඟ මඬල ලෙස යොදා ගනු ලබන්නේ .................................. ගැමි නාටකයේදී ය.

    VII. වෙස් නර්තන ශිල්පියා පපුවට පළඳින ආභරණය .................................. නමින් හඳුන්වයි.

    VIII. කොටවෙහෙරෙන් හමුවන එල්ලෙන ඇත් පහණ .................................. යුගයට අයත් වූවකි.

    IX. කථකලි නර්තනය සඳහා යොදා ගන්නා කථා පුවත් ඇතුළත් ග්‍රන්ථ 02 කි.

    .................................. , ..................................

    X. දෙවොල් නර්තනය .................................. සම්ප්‍රදායේ ද මුදුන්තාලය .................................. සම්ප්‍රදායේ ද ප්‍රචලිත නර්තන අංග 2 කි.

(ලකුණු 1x 12 = 12)

2. (I). මාත්‍රා 2+ 3 දෙතිතට අයත් බෙර පදයක්/දවුල් පදයක් ප්‍රස්තාර කරන්න. (ල.02)

(II) මාත්‍රා 4 තනි තිතට අයත් කවි පද 02 ක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

(III) මාත්‍රා 4 තනි තිතට අයත් වන්නමක/ සින්දු වන්නමක කස්තිරම/ ඉරට්ටිය/ ක්ලාසම ප්‍රස්ථාර කරන්න. (ල.06)

3. (I) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය නම් කර එහි පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ල.02)

(II) එම ශාන්තිකර්මයේදී භාවිතා කරනු ලබන රංග භාණ්ඩ 04 ක් නම් කරන්න. (ල.02)

(III) එම ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි 02 ක් විස්තර කරන්න. (ල.04)

(IV) නම් කරන ලද ශාන්තිකර්මය තුළින් සමාජයට ලබාදෙන යහපත් ආකල්ප පිළිබඳ විස්තරයක් කරන්න. (ල.04)

4. (I) පහත සඳහන් මාතෘකා අතුරින් 03ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

1. සතර අභිනය
2. වජිරා චිත්‍රසේන
3. ත්‍රිවිධ ලය.
4. අංග රචනය
5. මණ්ඩිය

(ල. 4x3 - 12)

5. (I) සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 02 ක් ලියන්න. (ල. 02)

(II) සොකරි ගැමි නාටකයෙහි කථා පුවත කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

(III) සොකරි රඟ මඩල පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 03)

(IV) එම නාටකයට අදාළ එක් චරිතයක් හඳුන්වාදීමේ කවියක් ලියන්න. (ල.04)

6. (I) කථකලි නර්තන සම්ප්‍රදාය ප්‍රභවය ලැබූ ප්‍රදේශය නම් කරන්න. (ල.02)

(II) කථකලි නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය, ප්‍රධාන ගායකයා, අනු ගායකයා නම් කරන්න. (ල. 04)

(III) කථකලි වේෂ නිරූපණය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල. 06)

7. (I) මානසික නිරෝගිතාවය පිළිබඳ නිගමනය කළ හැකි ඔබ දකින චර්යා ලක්ෂණ 03 ක් ලියන්න. (ල.03)

(II) නර්තන කලාව හැදෑරීමෙන් ඔබට ලබාගත හැකි ශාරීරික කුසලතා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 04)

(III) ඔබ නර්තන ක්‍රියාකාරකම් තුළ යෙදීමෙන් ලබන යහපත් මානසික තත්ත්වයන් විස්තර කරන්න. (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

3804

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 1 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (1)(2)(3)(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවයේ (×) ලකුණ යොදන්න.
iv. 1 හා 2 පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ එකට අමුණා භාරදෙන්න.

පහත දැක්වෙන පද්‍ය පාඨ ආශ්‍රයෙන් 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(A) අන්දම් කරුවලේ සොහොනේ සිටින් නේ
අන්දමකින් රෑ සිහිනේ පෙනෙන් නේ

(B) හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්

(C) ප්‍රේමයෙන් මන රන්ජිත වේ නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ

(D) අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇඳි රුවක් ලෙසේ

(E) ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි

1. කාන්තාවන් දරුවෙකු නලවන ආකාරයෙන් රංගනය කෙරෙන පද්‍ය කාණ්ඩය වන්නේ,
1. A  2. B  3. C  4. D

2. වෙස් මුහුණ පැළඳි ශාන්ති කර්මයට අයත් පද්‍ය කාණ්ඩය වන්නේ,
1. A  2. B  3. C  4. D

3. ජැක්සන් ඇන්තනී රංගනයෙන් දායක වන නාට්‍යයට අදාළ ගීතය වන්නේ,
1. D  2. A  3. C  4. B

4. ජන සංගීතය මුල් කර ගනිමින් නිර්මාණය කළ ගීතයක් වන්නේ,
1. D  2. E  3. C  4. B

5. දේශීය නාට්‍ය වංශයේ හැරවුම් ලක්ෂය ලෙස සලකන නාට්‍යයට අදාළ පද්‍ය කාණ්ඩය වන්නේ,

1. B 2. E 3. C 4. D

6. අනුවර්තන නාට්‍යයට අදාළ පද්‍ය කාණ්ඩය වන්නේ,

1. A 2. B 3. C 4. D

7. ශාන්ති කර්මයන්ට අදාළ පද්‍ය කාණ්ඩය වන්නේ,

1. BE 2. BC 3. AD 4. AB

8. දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍ය නිර්මාණයකට අයත් ගීත කාණ්ඩය,

1. B 2. C 3. D 4. E

9. B පද්‍යයට අදාළ නාට්‍ය කරුගේ තවත් නිර්මාණයකි,

1. නරිබෑනා 2. සුභ සහ යස 3. ස්වර්ණමාලී 4. සිංහබාහු

10. D පද්‍යයට අදාළ නොවන ශාන්ති කර්මය වන්නේ,

1. සොකරි 2. රටයකුම 3. කිරි මඩුව 4. සූනියම් යාගය

11. නාට්‍ය යනු,

A. ශ්‍රව්‍ය දෘෂ්‍ය රසවින්දන මාධ්‍යයකි.

B. නාට්‍යයක රංගකාලය අවකාශ භාවිතය සීමා රහිතය.

C. නාට්‍යයක මතුපිට අර්ථයට වඩා ගැඹුරු යටිපෙළ අර්ථයක් ගැබ් වේ.

D. සාමූහික නිර්මාණයකි.

ඉහත කියමන් අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,

1. A 2. B 3. C 4. D

12. 'නෘත්ත' යනු,

1. අපරදිග සංකල්පයකි.
2. භාව ප්‍රකාශනයෙන් තොර නර්තනයයි.
3. භරත නාට්‍යයෙහි ප්‍රධාන මාධ්‍යයයි.
4. සතර අභිනය මගින් ඉදිරිපත් කරන්නකි.

13 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත වගන්ති උපයෝගී කර ගන්න.

A. කරලිය

B. කමත

C. තානායම්පොළ

D. ශාන්තිකර්ම භූමිය

E. නූතන වේදිකාව

13. රංග භූමියේ විකාශන පිළිවෙළ විය යුත්තේ,

1. ABCDE 2. DBCAE 3. DCBAE 4. CBDAE

14. නාට්‍යයක් රඟ දක්වන ස්ථානයක් නොවන්නේ,

1. රංග පීඨය 2. කරළිය 3. රඟ මඬල 4. ප්‍රේක්ෂකාගාරය

15. ඉහත රංග භූමිවල ඉදිරිපත් කෙරුණු රඟුම් පිළිවෙළින් ඇත්තේ,

1. කෝළම්, නාඩගම්, සොකරි, ශාන්ති කර්ම, නූතන නාට්‍ය
2. නාඩගම්, කෝළම්, සොකරි, ශාන්ති කර්ම, නූතන නාට්‍ය
3. කෝළම්, සොකරි, නාඩගම්, ශාන්ති කර්ම, නූතන නාට්‍ය
4. ශාන්ති කර්මම, සොකරි, කෝළම්, නාඩගම්, නූතන නාට්‍ය

16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| සුභ සහ යස | බෝඩිංකාරයෝ | සෙක්කුව | කුවේණි | මනමේ |
| පුස්ලෝඩම් | එක වල්ලෙ පොල් | විනිශ්චය | හුණුවටය | සිංහබාහු |
| සුදු සහ කළු | තට්ටු ගෙවල් | වරන්දාස් | ජනේලය | කුසපබා |

16. සුගතපාල ද සිල්වා මහතාගේ නාට්‍ය නිර්මාණ කාණ්ඩය වන්නේ,

1. A 2. B 3. C 4. D

17. මානෙල් ජයසේන මහත්මිය රංගනයෙන් දායක වන නාට්‍ය කාණ්ඩය වනුයේ,

1. A 2. B 3. C 4. D

18. සයිමන් නවගත්තේගම මහතා නිර්මාණය කළ නාට්‍ය කාණ්ඩය වනුයේ,

1. A 2. B 3. C 4. D

19. විජය නන්දසිරි මහතා රංගනයෙන් දායක වූ නාට්‍ය නිර්මාණ අයත් කාණ්ඩය වනුයේ

1. E 2. D 3. C 4. B

20. පරාක්‍රම නිරිඇල්ලයන්ගේ නිර්මාණ එකතුව වන්නේ,

1. E 2. D 3. C 4. B

අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් <u>නොගැලපෙන</u> පිළිතුර තෝරන්න.

21. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වන්නේ,

1. රූපවාහිනිය 2. ගුවන්විදුලිය 3. සිනමාව 4. වේදිකා නාට්‍යය

22. කණ සම්බන්ධ සංවේදන අභ්‍යාසයක් නොවන්නේ,

1. කාසියක් බිම වැටෙන හඬ හඳුනා ගැනීම.
2. ජනේලයක් ඇරෙන හඬ හඳුනා ගැනීම.
3. සපත්තු හඬ හඳුනා ගැනීම.
4. සුවඳ කැවූ ලේන්සුවක් හඳුනා ගැනීම.

23. නාට්‍ය ධර්මී නාට්‍යයක් වන්නේ,

1. සිංහබාහු
2. මනමේ
3. මහාසාර
4. තලමල පිපිලා

24. නෘත්‍ය රංගනයකි.

1. වෙස් නැටුම්
2. කරදිය
3. නලදමයන්ති
4. හංසවිල

25. දික්තල කාලගෝල නාට්‍යයේ අන්තර්ගත චරිතයක් වනුයේ,

1. දික්තලා 2. මහෞෂධ 3. සොත්තානා 4. කාලගෝල

26. ලෝකධර්මී නාට්‍යයේ පුරෝගාමියා ලෙස සලකන්නේ,

1. පරාක්‍රම නිරිඇල්ල මහතා
2. ගාමිණී සමරකෝන් මහතා
3. සුගතපාල ද සිල්වා මහතා
4. ගාමිණී හත්තොටුවේගම මහතා

27. 'අපේ කට්ටිය' නමින් හැඳින්වූ නාට්‍ය කණ්ඩායමේ නිර්මාතෘ,

1. පරාක්‍රම නිරිඇල්ල මහතා
2. ධර්මසිරි බණ්ඩාරනායක මහතා
3. සුගතපාල ද සිල්වා මහතා
4. ගාමිණී හත්තොටුවේගම මහතා

28. ජන කරළිය ජංගම රඟමඬල නිර්මාණය කරණයේ පුරෝගාමියා,

1. පරාක්‍රම නිරිඇල්ල මහතා
2. ධර්මසිරි බණ්ඩාරනායක මහතා
3. සුගතපාල ද සිල්වා මහතා
4. ගාමිණී හත්තොටුවේගම මහතා

29. 'වමත පොත සහ සුරත කුඩය ද අනෙක බරණින් සැරසුනා' පද්‍ය කොටස ඔබට හමු වන්නේ,

1. සූනියම් යාගයෙහි ය.
2. දෙවොල් මඩුවෙහි ය.
3. සන්නියකුමෙහි ය.
4. රිද්දි යාගයෙහි ය.

30. වේදිකාව, සිනමාව, රූපවාහිනිය පමණක් නොව ගුවන් විදුලි නාට්‍ය වංශයේ පවා මතක සටහන් තැබූ නාට්‍යවේදියා වන්නේ,

1. පරාක්‍රම නිරිඇල්ල මහතා
2. විජේරත්න වරකාගොඩ මහතා
3. විජය නන්දසිරි මහතා
4. ශ්‍රියන්ත මෙන්ඩිස් මහතා

පහත දැක්වෙන රූප අතුරින් 31 සිට 34 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



අ.



ආ.



ඇ.



ඈ.

31. 'අනේ අබිලික්' නාට්‍යයේ රඟපෑමෙන් රංගනයට පිවිසියේ,

1. අ. නළුවා ය. 2. ආ. නළුවා ය. 3. ඇ. නිළියයි. 4. ඈ. නිළියයි.

32. මධුර ජවනිකා රංගනයෙන් ප්‍රේක්ෂක සිත් සතන් පැහැරගනු ලැබුයේ,

1. අ. නළුවා ය. 2. ආ. නළුවා ය. 3. ඇ. නිළියයි. 4. ඈ. නිළියයි.

33. සිංහල මෙන් ම ඉංග්‍රීසි නාට්‍ය සඳහා රංගනයෙන් දායක වූයේ,

1. අ. නළුවා ය. 2. ආ. නළුවා ය. 3. ඇ. නිළියයි. 4. ඈ. නිළියයි.

34. දෝන කතරිනා, විකෘති, සඳ ළඟ මරණය නාට්‍ය සඳහා රංගනයෙන් දායකත්වය ලබා දෙන්නේ,

1. අ. නළුවා ය. 2. ආ. නළුවා ය. 3. ඇ. නිළියයි. 4. ඈ. නිළියයි.

35. අංග රචනයේ දී මුහුණ ප්‍රධාන වශයෙන් කොටස්,

1. 6 කට බෙදේ. 2. 3 කට බෙදේ. 3. 4 කට බෙදේ. 4. 2 කට බෙදේ.

36. දික්තල කාලගෝල නාට්‍ය සඳහා සංගීත නිර්මාණය කරන ලද්දේ,

1. චාර්ලිස් සිල්වා ගුණසිංහ
2. පුන්‍යසේන ගුණසිංහ
3. නන්දන ගුණසිංහ
4. එදිරිවීර සරච්චන්ද්‍ර

37. පහතරට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක් නොවන්නේ,

1. රටයකුම
2. සන්නියකුම
3. සූනියම් යාගය
4. කඩවර කංකාරිය

38. ඓතිහාසික කතා පුවතක් පදනම් කරගෙන සැදූ නාට්‍ය නිර්මාණය වන්නේ,

1. මනමේ
2. නරිබෑනා
3. සුභ සහ යස
4. බෝඩිංකාරයෝ

39. දික්තල කාලගෝල කතාවට පදනම් වන්නේ,

1. සද්ධර්මරත්නාවලියයි
2. උම්මග්ග ජාතකයයි.
3. ත්‍රිපිටකයයි
4. මහා වංශයයි.

40. තම පරිකල්පන ශක්තිය මෙහෙයවා සිදු කළ යුතු චලන වර්ගය වනුයේ,

1. ස්වභාවික චලන
2. තාලානුකූල චලන
3. ශෛලිගත චලන
4. නිර්මිත චලන

The National e-learning Portal for General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

සැළකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   1) ඉහත නාට්‍යයේ නව නිෂ්පාදකවරයා නම් කරන්න. (ල.02)
   2) දික්තල කාලගෝල හැරුණු විට මෙහි එන තවත් ප්‍රධාන චරිත 02 ක් නම් කරන්න. (ල.02)
   3) මෙම නාට්‍යයේ රචකයා නම් කරන්න. (ල.02)
   4) උක්ත නාට්‍යයේ ශෛලිය හඳුනා ගැනීමට උදාහරණ 04ක් ඉදිරිපත් කරන්න. (ල.02)
   5) නාට්‍යයට අදාළ ගීතයක කොටසක් හෝ සංවාද කාණ්ඩයක් ලියා දක්වන්න. (ල.02)
   6) මෙහි නව නිර්මාණයේ දී නාට්‍ය අවසානයට එක් කළ නව අර්ථකථනය සැකෙවින් දක්වන්න. (ල.02)

2. I. රංග අභ්‍යාස යන්නෙහි අර්ථය ලියන්න.
   II. රංග අභ්‍යාස 04ක් නම් කරන්න.
   III. නළු කාර්යයේ දී රංග අභ්‍යාස වලින් ලැබෙන ප්‍රයෝජන පැහැදිළි කරන්න.

3. I. රංග ශෛලිය යන්න හඳුන්වන්න. (ල.02)
   II. ප්‍රධාන රංග ශෛලීන් නම් කර ඉන් එක් එක් රංග ශෛලියට අදාළව නිර්මාණය වුනු නාට්‍ය 02 බැගින් ඉදිරිපත් කරන්න. (ල.04)
   III. ඉන් එක් රංග ශෛලියක් අභිමත නාට්‍යක භාවිතා කර ඇති අයුරු කෙටියෙන් පහදන්න. (ල.06)

4. I. ඔබ දන්නා ශාන්තිකර්ම 03 ක් නම් කරන්න. (ල. 03)
   II. ඒ ඒ ශාන්ති කර්මයෙහි ඇති නාට්‍යමය අවස්ථා එක බැගින් සඳහන් කරන්න. (ල.03)
   III. ඉන් එක් නාට්‍යමය අවස්ථාවක ඇති නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිළි කරන්න. (ල.06)

5. I. ලංකාවේ වේදිකා නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිල්පීන්/ශිල්පිනියන් 06 දෙනකු නම් කරන්න. (ල. 03)

II. ඉන් 4ක් තෝරාගෙන ඔවුන් රංගනයෙන් දායක වූ නාට්‍ය එක බැගින් සඳහන් කරන්න. (ල.02)

III. ඔබ නම් කළ එක් ශිල්පියෙකු හෝ ශිල්පිනියකගෙන් නාට්‍ය කලාවට වූ සේවාව පිළිබඳ අගයන්න. (ල.05)

6. I. අංගරචනය හඳුන්වන්න. (ල.03)

II. අංගරචනයට භාවිතා කරන ද්‍රව්‍ය 04ක් හඳුන්වන්න. (ල.04)

III. වේදිකා නාට්‍යයක අංග රචනා කාර්යය ඔබට ලැබුණු විට ඔබ ඒ සඳහා කටයුතු කළ යුතු අයුරු පහදන්න. (ල.05)

7. කුඩා කාලයේ පටන් දැඩි මිත්‍රත්වයෙන් යුතුව පසුවෙන යහළුවන් දෙදෙනකු වෙයි. මෙම මිත්‍රත්වයේ වෙනසක් අත් විඳීමට එක් අයෙකුට අවැසි වේ. මේ නිසා ඔහු සිය මිතුරාට තරහා වී සිටීමට යෝජනා කරයි. මෙයට දැඩි ලෙස අකමැති වන අනෙක් මිතුරා අකමැත්තෙන් වුව ද වෙනස අත් විඳීමට එකඟ වෙයි. ඉන් පසු ......

- අභිමත ස්ථානයකින් පටන් ගෙන සුදුසු අවසානයක් කරා ගෙන යමින් විනාඩි 5 කට පමණ වන පරිදි පෙළක් නිර්මාණය කරන්න.

I. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ල. 04)

II. සංවාද, රංග විධාන සහිතව වේදිකාවට ගැලපෙන පරිදි පෙළ නිර්මාණය සඳහා (ල.08)